TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity

No. 5/1, Elibank Road, Colombo 05, Sri Lanka
Tele : (94) 11 4369781, 11 4369782, 11 4369783
Fax : (94) 11 2 501 707
Email : tisl@tisrilanka.org
Web: www.tisrilanka.org

2020 අප්‍රේල් 23

මහින්ද දේශප්‍රිය මහතා ,
සභාපති, ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව,
තැ.පෙ. 02, සරණ මාවත,
රාජගිරිය, 10107.

ගරු මහින්ද දේශප්‍රිය මහතාණෙනි,

<u>නුදුරේදී පැවැත්වීමට නියමිත මහ මැතිවරණයේදී ප්‍රමුඛතාවය දිය යුතු කාරණාවන්</u>

සුවිශේෂී කාල වකවානුවක රට පසු කරමින් සිටින අවස්ථාවකදී මැතිවරණ කොමිෂන් සභාවට එළඹීමට සිදු වුයේ ඉතා දුෂ්කර තීරණයකට බැව්, පොදු දේපළ අවභාවිත කිරීම පිලිබඳ ප්‍රමුඛව අවධානය යොමු කරමින් මැතිවරණ නිරීක්ෂණයේ යෙදෙන නිරීක්ෂණ සංවිධානයක් වශයෙන්, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයට අවබෝධ කර ගත හැකිය. මෙය, මහජන ආරක්ෂාව, මැතිවරණ නිලධාරීන්ගේ ආරක්ෂාව සහ නිදහස් හා සාධාරණ මැතිවරණයක අවශ්‍යතාවය යන කාරණාවන් අතර දෝලනය වන්නා වූ තීරණයකි."

මේ මොහොතේ අත්‍යවශ්‍ය සහන සේවා කටයුතු ක්‍රියාත්මක වීම අවශ්‍ය බව අපි පිළිගන්නෙමු. එමෙන්ම මැතිවරණ ප්‍රචාරණ සමය තුළ රාජ්‍ය දේපළ අවභාවිත වීම ශ්‍රී ලංකාවේ දීර්ඝ කාලයක් මුළුල්ලේ පවතින අභියෝගයක් වී ඇති බවද අපි දනිමු. මැතිවරණ ප්‍රචාරණ කාල සිමාව තුළ සහන සේවා කටයුතු ද  සිදු කෙරෙමින් පවතින හෙයින්, රාජ්‍ය දේපළ අවභාවිත කිරීම පිළිබඳව 2020 මාර්තු 03 වන දින නිකුත් කරන ලද දැනට පවතින චක්‍රලේඛනය(2020/03) මෙම සුවිශේෂී කාල වකවානුවට ප්‍රමාණවත් නොවන බව අපගේ විශ්වාසයයි.එමෙන්ම අදාළ චක්‍රලේඛනය මඟින් 2020 අප්‍රේල් මස 25 වන දින මැතිවරණ දිනය ලෙස නියම කරනු ලැබුවේ කොවිඩ් 19 වසංගතය සහ එහි ප්‍රතිවිපාක අත්දැකිමටත් පෙරාතුවය.

එබැවින් වත්මන් සහන ආධාර ලබාදීම පිලිබඳ සන්දර්භයට ද අනුබද්ධ වන ලෙසින්, පොදු දේපළ අවභාවිත කිරීම පිලිබඳ චක්‍ර ලේඛනය යාවත්කාලින කිරීමට මැතිවරණ කොමිසමේ අවධානය යොමු විය යුතුය. මෙමඟින් රාජ්‍ය දේපළ අවභාවිතය සහ සහන සේවා කටයුතු අතර ඇති වෙනස හඳුනා ගැනීමට රාජ්‍ය නිලධාරීන්ට සහ මැතිවරණ නිරීක්ෂකයන්ට ඉඩ ප්‍රස්ථාව සැලසෙනු ඇත. මැතිවරණ ප්‍රචාරණ කාල සිමාව තුළ සහන සේවා අනිවාර්යයෙන්ම කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉදිරියට ගෙන යාම අවශ්‍ය වන හෙයින් මෙම වෙනස්කම් අර්ථනිරූපණය කර තිබීම වැදගත් වේ.සංචරණයට ඇති සීමාව හේතුවෙන් ඉදිරි මැතිවරණයේදී මැතිවරණ නිරීක්ෂකයින්ගේ කටයුතුවලට නොවැළක්විය හැකි බලපෑමක් ඇති විය හැකි අතර මැතිවරණ නීති උල්ලංඝණය කල හැකි පිරිස්, මැතිවරණ නිරීක්ෂකයින් මඟින් වැළක්වීමේ හැකියාවද සැලකිය යුතු ලෙස අවම වනු ඇත. මේ මඟින් තවදුරටත් තහවුරු වන්නේ රාජ්‍ය නිළධාරීන් සහ සාමාන්‍ය ජනතාව වෙන  කවරදාටත් වඩා සුපරීක්ෂාකාරී විය යුතු බව  ඒත්තු ගැන්වීම උදෙසා චක්‍රලේඛය යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවයයි.

රාජ්‍ය දේපළ අවභාවිත වීමට එරෙහිව කටයුතු කිරීම යන අපගේ මුඛ්‍ය කාර්යභාර්යයද ඉක්මවා යමින්, අප දරන මතයද වන්නේ නිවේදනය කරන ලද මැතිවරණ දිනය (2020.ජූනි 20) නව පාර්ලිමේන්තුව කැඳවීමේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කාල සීමාවන්ට (Art.70(5)) පටහැණි වන බවයි. මෙය මැතිවරණයේ නිත්‍යානුකුලභාවය හා එහි ප්‍රතිඵලය කැඳවීමේදී ප්‍රශ්නකාරී බවක් ඉස්මතු කරනු ඇත.

සාධාරණ හා සාමකාමී මැතිවරණයක් සඳහා උක්ත කාරණාවන් ඔබගේ සැලකිල්ලට භාජනය වනු ඇතැයි අප උදක්ම බලාපොරොත්තු වන්නෙමු.

මෙයට විශ්වාසී,

....................................
එස්.සී.අශෝක ඔබේසේකර
විධායක අධ්‍යක්ෂ.

පිටපත් - 1. නලින් අබේසේකර මහතා,සාමාජික, ශ්‍රී ලංකා මැතිවරණ කොමිසම.

2. මහාචාර්‍ය රත්නජීවන්  හූල්, සාමාජික, ශ්‍රී ලංකා මැතිවරණ කොමිසම.

Reg No. GA 279 Chairperson: S.C.C. Elankovan Directors: Anushika Amarasinghe Shyamala Gomez Camena Guneratne Pavithra Kailasapathy
Company Secretary: Charuni Gunawardana Shreen Saroor T. Someswaran Tony Senewiratne Pulasthi Hewamanna